කාර්ය සාධන වාර්තාව 2022



රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සේවාවන් අතර,රබර් නව වගාව, රබර් නැවත වගාව, පරිණත වගාව සඳහා වැසි ආවරණ යෙදීම හා රබර් පැළ තවාන් පවත්වාගෙන යාම සුවිශේෂ වේ. 2022 වසරේ කුඩා වතු අංශයේ නැවත වගා ඉලක්කය හෙක්. 500 ක් වූ අතර,එම ඉලක්කය ඉක්මවා හෙක්. 522ක වගා කරවීමටත්, වැවිලි සමාගම් අංශයේ හෙක්. 700ක් වූ ඉලක්කය ඉක්මවා හෙක්.755 නැවත වගාව සිදු කරමින්, නැවත වගාව සඳහා සමස්ත ඉලක්කය වූ හෙක්. 1,200 වෙනුවට හෙක්.1,277ක නැවත වගාව සිදු කිරීමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි.

රබර් වගාව පැවති ඉඩම්වල රබර් වගාව ඉවත් කර වෙනත් විකල්ප වගා සඳහා යොමු වීම,එම ඉඩම් රබර් වගාවන් නොවන විකල්ප පරිහරණයන් සඳහා යෙදවීම මෑත කාලයේ දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. මේ තුළින් පවත්වාගෙන යන ඉඩම් ප්‍රමාණයේ අඩුවීමක් සිදු වන බැවින් එම ඉඩම් ප්‍රමාණය ස්ථාවර මට්ටමෙන් ඔබ්බට වැඩි කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරනු ලබන රබර් නව වගා වැඩසටහන ඉතා වැදගත් වේ. මෙම වැඩසටහනට අනුව 2022 වසරේ හෙක්. 500ක නව වගා කිරීම සඳහා හඳුනාගත් ඉලක්කය අනුව හෙක්.489ක රබර් වගාව සිදුකරමින් එකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත් ව ඇත.

රටේ කාලගුණික රටාව වෙනස් වෙමින් පවතින මෙවන් අවධියක වසර පුරා ව්‍යාප්තව පවතින වර්ෂාව රබර් නිෂ්පාදනයේ ඵලදායිතාවයට මහත් බාධාවක් ව ඇත. මෙම තත්ත්වය තුළ දෙපාර්තමේන්තුව විසින් වසරේ වැසි ආවරණ යෙදීමේ ඉලක්ක ලෙස, කුඩා වතු අංශයේ හෙක්. 800 ක හා වැවිලි සමාගම් අංශයේ හෙක්.2,500ක වැසි ආවරණ යෙදීම සඳහා ඉලක්ක හඳුනාගෙන ඇත.මෙම ඉලක්කවලින් කුඩා වතු අංශයේ හෙක්. 817ක් හා වැවිලි සමාගම් අංශයේ හෙක්. 2,774 සම්පූර්ණ කරමින් වැසි ආවරණ යෙදීමේ සාර්ථක ප්‍රගතියක් ළඟා කර ගෙන ඇත. මෙමඟින් අඩුවෙමින් තිබූ වාර්ෂික රබර් නිෂ්පාදනය යම් ස්ථාවර අගයකට ගැනීමට හැකියාව ලැබී ඇත.

වගාව සඳහා 2022 වසරේදී ඇතිවූ ඉල්ලුම වැඩිවීම සමඟ රබර් පැළ අවශ්‍යතාවයද වැඩිවී ඇත. දෙපාර්තමේන්තුවට අයත් තවාන් වෙතින් නිකුත් කරන පැළවල පවතින ගුණාත්මක තත්ත්වය අනුව එම තවාන්වල පැළ සඳහාද වැඩි ඉල්ලුමක් ඇතිවිය. ඒ අනුව 2022 වසරේදී දෙපාර්තමේන්තු තවාන් මඟින් නිෂ්පාදනය කරන ලද පැළ සංඛ්‍යාව පැළ මිලියන 1.3ක ඉහළ අගයක් ගෙන ඇත. මේ තුළින් ප්‍රධානවම කුඩාවතු අංශයේ පැළ අවශ්‍යතාවයද වැවිලි සමාගම්වල අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක් සැපයීමට ද හැකියාව ලැබුණි.

2022 වසරේ රබර් අංශයේ අපනයන ආදායම රු.මි. 327,277 ක් වූ අතර, එම අගය 2021 වසරේ පැවති ඩොලර් බිලියන 01ක අගය සමඟ සමපාතවීමකි. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය පහත වැටෙමින් පැවති වසරක,අපනයන ආදායම පහළ වැටෙමින් විදේශ විනිමය ප්‍රමාණය ක්ෂය වෙමින් තිබියදී,රටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය වැඩි කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කිරීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව දායක වූ වසරක් ලෙස මෙම වසර හඳුන්වා දිය හැකිය.

මාධව වර්ණකුලසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

දැක්ම, මෙහෙවර, ආයතනයේ අරමුණු **01**

1. හැඳින්වීම **02-07**

1.1. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 02
1.2. රබර් වගාව 02
1.3. ආයතනයේ ප්‍රධාන කාර්යයන් 03
1.3.1.ප්‍රධාන කාර්යාලයේ කාර්යයන් 03
1.3.2.ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන් 03
1.3.3.රබර් පැළ තවාන්වල කාර්යයන් 03
1.4. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 04
1.5. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය 05
1.6. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු 06

2. දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය **08-32**

2.1. රබර් නැවත වගාව 08
2.1.1.රබර් නැවත වගාව - කුඩාවතු අංශය 08
2.1.2.රබර් නැවත වගාව - වැවිලි අංශය 10
2.2. රබර් නව වගාව 10
2.3. රබර් පැළ නිෂ්පාදනය 12
2.3.1.රජයේ පැළ තවාන් 12
2.3.2.පැළ නිෂ්පාදනය (පෞද්ගලික පැළ තවාන්) 13
2.4. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන 13
2.5. අතුරු බෝග වගාව 15
2.6. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් 17
2.6.1.කිරි කැපුම් ශිල්පී පුහුණුව 17
2.6.2.බද්ධකරුවන් පුහුණුව 18
2.6.3.වැසි ආවරණ යෙදීමට පුහුණුව 18
2.6.4.රබර් වගාවේ රෝග පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන 19
2.7. 2022 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 20
2.8. කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක උප ව්‍යාපෘති 21
2.9. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු- 2022 22
2.9.1.රබර් වගා බිම් ප්‍රමාණය 22
2.9.2.රබර් නිෂ්පාදන වියදම 23
2.9.3.ස්වාභාවික රබර් අපනයනය 23
2.9.4.ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය 23
2.9.5.සමස්ත රබර් අපනයන ආදායම(රටවල් අනුව)- 2022 24
2.9.6.ස්වභාවික රබර් ආනයනය 25
2.9.7.සමස්ත රබර්ආනයනය (රටවල් අනුව)- 2022 26
2.9.8.රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන්රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍ය 27
2.10. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු 29

2.11. ඒකාබද්ධ අරමුදල 30
2.12. සෙස් බදු අය කිරීම. 31

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය 33-43

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 33
3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 34
3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය 35
3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 35
3.5. විගණකාධිපති වාර්තාව 36
3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 41
3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 42

4. කාර්ය සාධන දර්ශක 44

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 44

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය 45-47

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 45
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 47

6. මානව සම්පත් පැතිකඩ 48-51

6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය 48
6.2. මානව සම්පත් සංවර්ධනය 48
6.3. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2022.12.31 දිනට 49
6.4. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය 49
6.5. 2022 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය 50

7. අනුකූලතා වාර්තාව 52-57

දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කොටස්කරු වීම.

මෙහෙවර

නෛතිකව දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල හා කාර්යයන්ට අනුගතව ශ්‍රී ලංකාවේ රබර් වගාව හා රබර් වගාව ආශ්‍රිත කර්මාන්තයන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීම

ආයතනයේ අරමුණු

- පවතින රබර් වගා ඉඩම්හි ඵලදායීතාවය ඉහළ නැංවීම හා රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම තුළින් දේශීය රබර් නිෂ්පාදනය ඉහළ නැංවීම.
- රබර් හා රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය වැඩි කිරීම තුළින් රබර් සඳහා වැඩි මිලක් ලබා ගැනීම හා ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම.
- ක්ෂේත්‍රයේ රැකියා උත්පාදනය ඉහළ නැංවීම තුළින් සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- දේශීය දැව අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා දායක වීම.
- ස්වභාවික පරිසරයේ සමතුලිතතාවය ආරක්ෂා කිරීම සඳහා වගාවේ තිරසාර භාවය තහවුරු කිරීම.

1. හැඳින්වීම

1.1. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

1876 දී ලංකාවේ ආරම්භ වුණු රබර් වගාවේ ව්‍යාප්තිය හා පරිපාලනය සඳහා 1934 අංක 06 දරණ ආඥාපනත මඟින් පිහිටුවන ලද **රබර් පාලන දෙපාර්තමේන්තුව** වෙත, 1956 අංක 11 දරණ රබර් පාලන පනත මඟින් තවදුරටත් බලතල හා වගකීම් පවරා දී ඇත.

ඒ අනුව, රබර් වගාවේ උන්නතිය වෙනුවෙන් රබර් වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම, රබර් වගාව ලියාපදිංචි කිරීම, ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය හා බෙදාහැරීම, දේශීයව රබර් මිලදී ගැනීම සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම, රබර් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා වගාව සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම රබර් පාලන දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලැබේ. වාණිජ බෝගයන් අතර රබර් වගාව වැදගත් ස්ථානයක් හිමි කර ගැනීම, ශ්‍රී ලංකාවේ රබර් වගාව වැඩි වශයෙන් ව්‍යාප්ත වීමට බලපා ඇත. රබර් වගාව තවදුරටත් වර්ධනය කිරීම සඳහා 1953 අංක 36 දරණ රබර් නැවත වගාකිරීමේ පනත ක්‍රියාත්මක කර ශ්‍රී ලංකාවේ රබර් නැවත වගාව සඳහා ආධාර ලබාදීම ආරම්භ කර ඇත. ඒ අනුව, රබර් පාලන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවදුරටත් පුළුල් වී ඇත. එම කාර්යභාරය තවදුරටත් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා 1994 දී රබර් පාලන දෙපාර්තමේන්තුව අහෝසි කර **රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව** පිහිටුවා ඇත.

බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටුවා ඇති රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා දිවයිනේ සියළු රබර් වගාකරන ප්‍රදේශ ආවරණය වන පරිදි කෑගල්ල, කළුතර, රත්නපුර, ගාල්ල හා මොනරාගල පිහිටුවා ඇති රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල මඟින් රබර් වගාවේ ව්‍යාප්ති සේවා සිදු කරනු ලැබේ.

මීට අමතරව, රබර් වගාව සඳහා අවශ්‍ය පැළ නිෂ්පාදනය සඳහා දෙපාර්තමේන්තුව මඟින් වැලිකඩමුල්ල, මීරිගම, ඇඟල්ඔය, ගුරුගොඩ ,කරපිංච, මිද්දෙණිය, කුඹුක්කන හා පදියතලාව ප්‍රදේශ වල රබර් පැළ තවාන් 08 ක් ස්ථාපිත කර ඇත.

1.2. රබර් වගාව

අපනයනාභිමුඛ වගාවක් ලෙස ආරම්භ වූ රබර් වගාව ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන තෙක්ම පැවතියේ ප්‍රධාන වශයෙන් අමුද්‍රව්‍ය අපනයනය කේන්ද්‍රකරගත් වගාවක් ලෙසය. ශ්‍රී ලංකාවේ රබර් වල පවතින ගුණාත්මකභාවය හා රබර් පහසුවෙන් ලබාගැනීමේ හැකියාව මත ප්‍රධාන වශයෙන් විදේශීය සමාගම් ශ්‍රී ලංකාවේ රබර් ආශ්‍රිත කර්මාන්ත ස්ථාපනය කිරීමට කටයුතු කර ඇත. ඒ සමඟම ක්‍රියාත්මක වූ දේශීය ආයතන කිහිපයක්ම රබර් ආශ්‍රිත කර්මාන්තශාලා ආරම්භ කර ඇත. මෙම තත්වය තුල, ශ්‍රී ලංකාවේ රබර් දේශීය වශයෙන් පරිභෝජනය වැඩිවී ඇති අතර අමුද්‍රව්‍ය ලෙස රබර් අපනයනය අඩුවී ඇත.

ශ්‍රී ලංකාව දැනට රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනයේ ප්‍රමුඛත්වයක් හිමිකර ගනිමින්, රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ අපනයනය කරමින්, වසරකට ඩොලර් බිලියන 01 කට වඩා වැඩි අපනයන ආදායමක් උපයමින් සිටී. අනෙක් අතට රබර් ආශ්‍රිත කර්මාන්ත මෙරට ස්ථාපිත වීමත් සමඟ ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා වැඩි ප්‍රමාණයක් ජනනය වී ඇත.

දැනට, ශ්‍රී ලංකාවේ රබර් වගාව ව්‍යාපාරික වශයෙන් සිදුවුවද, රබර් නිෂ්පාදන වියදමට සාපේක්ෂව විටින් විට ඇතිවන රබර් මිලෙහි අඩුවීම රබර් වගාවේ තිරසාරත්වයට තර්ජනයක් වී ඇත.

1.3 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1.3.1 ප්‍රධාන කාර්යාලයේ කාර්යයන්

© ප්‍රධාන පනත් හා නෛතික මූලාශ්‍ර මගින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

- නැවත වගා සහ නව වගා සහනාධාර ක්‍රම ක්‍රියාත්මක කිරීම හා ප්‍රාදේශීය කාර්යාල මගින් සහනාධාර ලබාදීම අධීක්ෂණය කිරීම.
- රජයේ තවාන් මගින් උසස් වර්ගයේ බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම හා ලබා දීම.
- රබර් වගාව හා වෙළඳාම සඳහා බලපත්‍ර ලබා දීම.
- රබර් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය, දේශීය පරිභෝජනය, අපනයනය හා ආනයනය පිළිබඳ දත්ත හා තොරතුරු යාවත්කාලීන කර පවත්වා ගැනීම.
- රබර් වෙළඳපල පිළිබඳව කුඩා රබර් වතු හිමියන් දැනුවත් කිරීම.
- ස්වභාවික රබර් නිෂ්පාදනය, පරිභෝජනය හා වෙළඳාම සම්බන්ධව අන්තර්ජාතික සංවිධාන සමඟ කටයුතු කිරීම.
- සෙස් අරමුදල් එකතු කිරීම හා පරිපාලනය.
- රබර් වගාවේ හා නිෂ්පාදනයේ ඒ ඒ අවධිවලට අදාලව කුඩා වතු ඉඩම් හිමියන් වෙත අවශ්‍ය දැනුම හා උපදෙස් ලබා දීම.
- කුඩා වතු ඉඩම් හිමියාගේ ආර්ථික උන්නතිය උදෙසා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රබර් අංශයේ ඵලදායිතාවය හා නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ප්‍රමුඛ ආයතනය ලෙස කටයුතු කිරීම.
- රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම හා එක්රැස් කිරීම.
- ප්‍රාදේශීය කාර්යාල අධීක්ෂණය කිරීම.

1.3.2 ප්‍රාදේශීය කාර්යාල මඟින් ඉටු කරන කාර්යයන්

- රබර් වගාව සඳහා බලපත්‍ර ලබා දීම හා ඉඩම් ලියාපදිංචි කිරීම.
- රබර් නැවත වගාව හා නව වගාව සිදු කිරීම.
- වගාකරුවන් සඳහා වගා සහනාධාර ලබා දීම ඇතුළු අනෙකුත් සේවා ලබාදීම.
- රබර් වෙළඳ හිමියන් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීම.
- රජයේ රබර් පැළ තවාන් පවත්වාගෙන යාම,රබර් පැළ බෙදා හැරීම හා පුද්ගලික පැළ තවාන් අධීක්ෂණය.
- කුඩා වතු හිමියන් හා වතු හිමියන් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
- රබර් වගාවට වැළඳෙන රෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනුවත් කර රෝග පාලනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රබර් වගා හිමියන්ගේ ආර්ථික ශක්තිය නගා සිටුවීම සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- රබර් වගාව සම්බන්ධ දැනුම හා පුහුණුව ලබා දීම.

1.3.3 රබර් පැල තවාන්වල කාර්යයන්

- රබර් පර්යේෂණායතනයේ නිර්දේශ මත නැවත වගාව හා නව වගාව සඳහා අවශ්‍ය ප්‍රමිතියෙන් උසස් බද්ධ රබර් පැළ නිෂ්පාදනය කිරීම.
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නව ක්ලෝන සොයා ගැනීම් වලට අනුව වැඩි දියුණු කරන ලද ප්‍රභේද ගොවීන්ට හඳුන්වා දීම.
- අවශ්‍ය අවස්ථාවලදී වැවිලි සමාගම් වල පැල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම.
- රබර් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ වගාවන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

1.4 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය



1.6 දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

අනු අංකය	තනතුර	අනුමත ප්‍රමාණය	දැනට සිටින ප්‍රමාණය	පුරප්පාඩු ප්‍රමාණය	අතිරික්ත ප්‍රමාණය
01	අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ-විශේෂ ශ්‍රේණිය)	1	1	0	0
02	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලං.ප.සේ - විශේෂ ශ්‍රේණිය)	1	1	0	0
03	අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ- ප්‍රාදේශීය (ශ්‍රී ලං.ප.සේ -I ශ්‍රේණිය)	7	5	2	0
04	අධ්‍යක්ෂ(ශ්‍රී ලං.ක්‍ර.සේ.-I ශ්‍රේණිය)	1	1	0	0
05	අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1	0
06	ප්‍රධාන ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ-I ශ්‍රේණිය)	1	1	0	0
07	ප්‍රධාන අභ්‍යන්තර විගණක (ශ්‍රී ලං. ග. සේ.- I ශ්‍රේණිය)	1	1	0	0
08	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ- II , III ශ්‍රේණිය)	12	7	5	0
09	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ - II , III ශ්‍රේණිය)	1	1	0	0
10	නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)	1	0	1	0
11	නීති නිලධාරි (දෙපාර්තමේන්තුගත)	1	0	1	0
12	ගණකාධිකාරි (ශ්‍රී ලං.ග.සේ - II , III ශ්‍රේණිය)	6	4	2	0
13	නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ- II ශ්‍රේණිය)	1	1	0	0
14	සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.තො. හා සන්.තා.සේ III)	2	1	1	0
15	පරිපාලන නිලධාරි (රා.ක.ස.සේ.- විශේෂ)	4	2	2	0
16	ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරි - ව්‍යාප්ති (දෙපාර්තමේන්තුගත-අධි ශ්‍රේණිය)	17	6	11	0
17	භාෂා පරිවර්තක - සිංහල/දෙමළ (හා. ප. සේ)	1	0	1	0
18	තොරතුරු තාක්ෂණ නිලධාරි (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	2	0	2	0
19	තොරතුරු තාක්ෂණ සහකාර (ශ්‍රී ලං.තො හා සන්.තා.සේ)	5	2	3	0
20	සංවර්ධන නිලධාරි (සං. නි. සේ)	22	68	0	46
21	ලිපිකරු/යතුරු ලේඛක (දෙපාර්තුමේන්තුගත)	6	1	5	0
22	තවාන් කළමණාකරු	2	2	0	0

	(දෙපාර්තුමේන්තුගත)				
23	ගොඩනැගිලි නඩත්තු නිළධාරි (දෙපාර්තුමේන්තුගත)	1	1	0	0
24	කළමණාකාර සේවා නිලධාරි (ක.සේ.නි.සේ.)	122	120	2	0
25	කළමණාකාර සහකාර (ක.ස.)	8	7	1	0
26	රබර් සංවර්ධන නිලධාරි (දෙපාර්තුමේන්තුගත)	170	123	47	0
27	රියදුරු (රි.සේ.)	40	25	15	0
28	රියදුරු (දෙපාර්තුමේන්තුගත)	1	01	0	0
29	ලොරි සහයක (දෙපාර්තුමේන්තුගත)	10	10	0	0
30	කාර්යාල කාර්ය සහයක (කා.කා.ස.)	33	30	3	0
	එකතුව	**481**	**422**	**105**	**46**

වගු අංක I

2. දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්හි ප්‍රගතිය

ශ්‍රී ලංකාව තුළ රබර් වගාව ව්‍යාප්ත කිරීම මඟින් විදේශ විනිමය ඉපයීම වැඩිකිරීමේ අරමුණ ළඟා කර ගැනීම උදෙසා, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2022 වර්ෂයේ දී පහත වැඩසටහන් මූලික වශයෙන් ක්‍රියාත්මක කර ඇත.

1. **රබර් නැවත වගා කිරීමේ වැඩසටහන - (කුඩා වතු/ වැවිලි සමාගම්)**
2. **රබර් නව වගාකිරීමේ වැඩසටහන (කුඩා වතු)**
3. **රබර් පැළ නිෂ්පාදනය (රජයේ තවාන් / පෞද්ගලික පැළ තවාන්)**
4. **වැසි ආවරණ යෙදීමේ වැඩසටහන - (කුඩා වතු / වැවිලි සමාගම්)**
5. **අතුරු භෝග වගා වැඩසටහන**
6. **රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන්**
7. **2022 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති**
8. **කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක උප ව්‍යාපෘති**

2.1. රබර් නැවත වගාව

රබර් වගාවේ අස්වැන්න අඩුවන විට පරිණත රබර් ගස් ගලවා ඉවත් කර, අලුත් රබර් පැළ නැවත වගා කිරීමේ අවශ්‍යතාවය, රබර් ශාකයක් ක්ෂේත්‍රයේ ස්ථාපනය කර වසර 30 කට ආසන්න කාලයක් ගත වන විට ඇති වේ. ඒ අනුව නැවත වගාව වෙත ගොවීන් නැඹුරු කරලීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් කුඩා වතු හිමියන්ට සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත නැවත වගා කරනු ලබන ඉඩම් හෙක්ටයාර් එකක් සඳහා රු. 350,000 ක් බැගින් වගා සහනාධාර ලබා දේ.

2.1.1. රබර් නැවත වගාව- කුඩා වතු අංශය

2022 වසර සඳහා කුඩා වතු අංශයේ හෙක්. 500 ක් වූ රබර් නැවත වගා ඉලක්ක අනුව දෙපාර්තමේන්තුව අත් කර ගෙන ඇති භෞතික ප්‍රගතියට අදාළ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ

බිම් ප්‍රමාණය -2022

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම්පත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	නිකුත් කළ බලපත්‍රවලට අදාළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගාව සිදු කළ බලපත්‍ර ලාභීන් සංඛ්‍යාව	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගාව සිදු කළ ගොවීන් සංඛ්‍යාව
රත්නපුර	80	148	140.47	136	111.32	88	68.55	88
කොළඹ	20	39	37.14	38	32.07	32	28.96	32
මොනරාගල	7	7	3.64	6	3.64	6	3.64	6
බදුල්ල	8	1	6.88	1	6.88	1	6.61	1
ගාල්ල	5	4	3.91	4	3.91	1	2.43	1
මාතර	10	25	29.05	25	29.05	16	18.04	15
කෑගල්ල	215	575	344.56	511	307.20	388	228.62	363
ගම්පහ	20	50	39.97	42	33.59	30	22.14	23
කුරුණෑගල	20	37	29.79	32	24.43	27	21.43	26
මහනුවර	10	63	30.63	57	28.04	39	20.82	33
මාතලේ	5	2	7.29	2	7.29	2	7.29	1
කළුතර	100	210	154.87	187	139.14	136	93.91	136
එකතුව	**500**	**1,161**	**828.20**	**1,041**	**726.57**	**766**	**522.44**	**725**

වගු අංක II

2022 වර්ෂයේ දී කුඩා වතු අංශයේ රබර් වගාකරුවන්, නැවත වගාව සඳහා 1,161 ක අයදුම් පත්‍ර ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර, ඉන් අයදුම් පත්‍ර 1,041 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කර ඇත. එම බලපත්‍ර යටතේ බලපත්‍රලාභීන් 766 දෙනෙකු විසින් හෙක්. 522.44 ක භූමි ප්‍රමාණයක රබර් නැවත වගාව සිදු කර ඇත. 2022 වර්ෂයේ කුඩා වතු අංශයේ රබර් නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 500 ක් වශයෙන් පැවතියදී, එම වසරේ වගාකළ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 522.44ක ඉහළ අගයක් ගැනීම සාධනීය ලක්ෂණයකි.

2.1.2. රබර් නැවත වගාව -වැවිලි අංශය

වැවිලි සමාගම් විසින් 2022 වසරේ දී සිදු කළ රබර් නැවත වගාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

රබර් නැවත වගාව වැවිලි සමාගම් - 2022

වැවිලි සමාගමේ නම	ලැබුණු ඉල්ලුම්පත් අනුව බිම් ප්‍රමාණය (හෙක්.)	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නැවත වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
පුස්සැල්ලාව වැවිලි සමාගම	219.74	161.21	154.21
බලංගොඩ වැවිලි සමාගම	31.12	26.77	26.77
කහවත්ත වැවිලි සමාගම	8.18	8.04	8.04
අගලවත්ත වැවිලි සමාගම	374.70	227.30	161.63
ලලාන් වැවිලි සමාගම	107.95	104.40	97.84
කෑගල්ල වැවිලි සමාගම	93.58	89.58	84.40
කැලණිවැලි වැවිලි සමාගම	52.22	37.93	37.93
මල්වත්ත වැවිලි සමාගම	38.45	34.45	34.45
ඇල්කඩුව වැවිලි සමාගම	5.00	5.00	5.00
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	17.70	17.70	8.50
නමුණුකුල වැවිලි සමාගම	74.18	40.16	34.23
හොරණ වැවිලි සමාගම	26.93	14.92	14.92
කොටගල වැවිලි සමාගම	140.06	70.42	70.42
ඇල්පිටිය වැවිලි සමාගම	34.62	34.62	15.73
එකතුව	**1,224.43**	**872.50**	**754.07**

වගු අංක III

ඉහත වගුව අනුව 2022 වසර සඳහා වැවිලි සමාගම් අංශයේ රබර් නැවත වගා ඉලක්කය හෙක්. 700ක් ව පැවතියදී, 2022 වසරේ වැවිලි සමාගම් විසින් හෙක්.754.07ක් වගා කර දෙපාර්තමේන්තුවේ නැවත වගා ඉලක්කය සම්පූර්ණ කිරීම සඳහා ප්‍රශංසනීය දායකත්වයන් සලසා ඇති බව පැහැදිලි වේ.

2.2. රබර් නව වගාව

ශ්‍රී ලංකාවේ පවතින රබර් ඉඩම් ප්‍රමාණය වැඩි කරමින් රබර් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් කුඩා වතු අංශයේ හෙක්ටයාර එකක රබර් නව වගාව සඳහා රු. 300,000 ක මුදලක් වගා සහනාධාර ලෙස ලබා දෙනු ලැබේ. නව වගාව සඳහා දෙපාර්තමේන්තුව මඟින් 2022 වසර සඳහා හඳුනා ගත් ඉලක්කය හෙක්.500 කි.

දෙපාර්තමේන්තුවේ සහනාධාර යටතේ රබර් නව වගා කළ බිම් ප්‍රමාණය - 2022 (කුඩාවතු)

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	ලැබුණු අයදුම් පත්‍ර සංඛ්‍යාව	අයදුම් පත්‍ර වලට අදාල බිම් ප්‍රමාණය (හෙක්.)	නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව	බලපත්‍ර නිකුත් කළ බිම් ප්‍රමාණය (හෙක්.)	නව වගා කළ බල පත්‍ර ලාභීන් සංඛ්‍යාව	නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	ඇටවර ගෙවන ලද ගොවීන් සංඛ්‍යාව
රත්නපුර	30	84	45.23	84	45.23	56	24.93	55
කොළඹ	10	21	9.36	21	9.36	19	7.38	19
මොනරාගල	260	499	350.83	443	305.14	443	292.13	212
බදුල්ල	20	38	29.17	26	10.16	26	10.17	15
අම්පාර	20	22	11.94	13	6.52	13	6.52	12
ගාල්ල	10	19	9.40	19	9.40	16	4.83	16
මාතර	15	21	21.09	21	21.09	17	17.56	14
හම්බන්තොට	15	29	14.91	29	14.91	24	12.28	24
කෑගල්ල	35	198	82.00	165	64.67	131	52.00	127
ගම්පහ	10	14	15.25	14	15.05	6	8.47	3
කුරුණෑගල	10	29	16.51	29	14.76	23	12.25	17
මහනුවර	5	40	14.09	34	12.21	26	8.60	19
මාතලේ	20	12	15.71	12	15.71	10	14.17	8
අනුරාධපුරය	20	20	11.06	13	7.48	7	2.83	7
කළුතර	20	79	34.33	70	26.44	50	15.32	50
එකතුව	**500**	**1,125**	**680.88**	**993**	**578.13**	**867**	**489.44**	**598**

වගු අංක IV

ඉහත වගුවට අනුව 2022 වසරේ දී මොනරාගල, කෑගල්ල යන දිස්ත්‍රික්ක රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නව වගා දෙපාර්තමේන්තු ඉලක්කය සම්පූර්ණ කිරීමේදී වැඩි දායකත්වයක් ලබා දී ඇත.

2017 වසර සිට 2022 වසර දක්වා ශ්‍රී ලංකාවේ රබර් නව වගාව සිදු කළ මුළු බිම් ප්‍රමාණය පහත වගුවේ දක්වා ඇත.

රබර් නව වගා බිම් ප්‍රමාණය 2017– 2022(හෙක්.)

වර්ෂය	කුඩා වතු	වැවිලි සමාගම්	එකතුව
2017	700	335	1,035
2018	981	48	1,029
2019	1,103	-	1,103
2020	726	25	751
2021	1,186	02	1,188
2022	**489**	**15**	**504**

වගු අංක V

2.3. රබර් පැළ නිෂ්පාදනය

2.3.1. රජයේ පැළ තවාන්

රබර් පර්යේෂණ ආයතනය හා සම්බන්ධ වෙමින් නිරන්තරයෙන් ඔවුන්ගේ පර්යේෂණ මඟින් සොයාගන්නා නව සොයාගැනීම් අනුව ගුණාත්මක රබර් පැළ නිෂ්පාදනය කිරීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇති රබර් පැළ තවාන් 08 මඟින් 2022 වසරේ සිදු කරන ලද රබර් පැළ නිෂ්පාදනය හා පැළ බෙදා හැරීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ පැළ තවාන්හි පැළ නිෂ්පාදනය සහ පැළ බෙදා හැරීම - 2022

තවානේ නම	පැළ නිෂ්පාදන ඉලක්කය	නිෂ්පාදිත පැළ සංඛ්‍යාව	බෙදා හරින ලද පැළ සංඛ්‍යාව
කරපිංච	75,000	85,189	60,862
කුඹුක්කන	300,000	404,795	274,101
පදියතලාව	100,000	91,778	76,760
මිද්දෙණිය	75,000	68,457	48,813
වැලිකඩමුල්ල	300,000	292,716	184,352
මීරිගම	150,000	145,785	106,538
ඇගල්ඔය	250,000	69,212	59,378
ගුරුගොඩ	250,000	152,972	120,153
එකතුව	**1,500,000**	**1,310,904**	**930,957**

වගු අංක VI

වගුවේ සඳහන් පරිදි 2022 වර්ෂයේ පැළ 1,500,000ක නිෂ්පාදන ඉලක්කය අනුව රබර් පැල 1,310,904ක් කිරීමට හා, ඉන් පැළ 930,957 ක් නව වගා හා නැවත වගා සඳහා බෙදා හැරීමට කටයුතු කර ඇත.

2022 වර්ෂයේ රජයේ පැළ තවාන්හි පැළ බෙදා හැරීම අංශ අනුව පහත වගුවේ දක්වා ඇත.

තවානේ නම	**2022** වසරේ රබර් පැළ බෙදා හැරීම						එකතුව
	STaRR ව්‍යාපෘතිය	කුඩා වතු	වැවිලි සමාගම්	රබර් පර්යේෂණ ආයතනය	පුද්ගලික තවාන්	වෙනත්	
කරපිංච	-	60,842	-	20	-	-	60,862
කුඹුක්කන	96,850	141,469	27,829	542	2,050	5,361	274,101
පදියතලාව	35,365	40,775	620	-	-	-	76,760
මිද්දෙණිය	22,160	26,653	-	-	-	-	48,813
වැලිකඩමුල්ල	34,815	138,847	5,900	1,000	-	3,790	184,352
මීරිගම	11,800	90,744	1,136	-	-	2,858	106,538
ඇගල්ඔය	29,805	25,965	1,750	-	-	1,858	59,378
ගුරුගොඩ	60,600	53,649	4,475	-	-	1,429	120,153
එකතුව	**291,395**	**578,944**	**41,710**	**1,562**	**2,050**	**15,296**	**930,957**

වගු අංක VII

2.3.2. පෞද්ගලික පැළ තවාන්

ශ්‍රී ලංකාවේ නැවත වගා හා නව වගා සඳහා වාර්ෂික පැළ අවශ්‍යතාවය මුළුමනින්ම සැපිරීම රජයේ තවාන් මඟින් සිදු නොවේ. පැළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමේදී පෞද්ගලික තවාන් හිමියන් මෙන්ම වැවිලි සමාගම් ද සැළකිය යුතු දායකත්වයක් සපයති. 2022 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව පෞද්ගලික අංශයේ පැළ නිෂ්පාදනය හා බෙදා හැරීම පහත දැක්වේ.

පැළ නිෂ්පාදනය හා බෙදා හැරීම - 2022 (පෞද්ගලික පැළ තවාන්)

දිස්ත්‍රික්කය	පැළ නිෂ්පාදනය	පැළ බෙදා හැරීම
රත්නපුර	183,000	141,750
කොළඹ	153,360	100,750
මොනරාගල	99,200	20,000
ගාල්ල	37,439	16,986
කෑගල්ල	563,700	389,109
ගම්පහ	72,000	47,512
කුරුණෑගල	4,200	2,700
මහනුවර	12,430	7,542
කළුතර	180,642	63,849
එකතුව	**1,305,971**	**790,198**

වගු අංක VIII

2.4. වැසි ආවරණ යෙදීමේ වැඩසටහන

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සහනාධාර ලබා දෙනු ලබන වැසි ආවරණ යෙදීමේ වැඩසටහනට අනුව, සාර්ථකව වැසි ආවරණ යොදා ඇති කුඩා ඉඩම් රබර් වතු හිමියන්ගේ, එක් රබර් ගසකට රු. 70/- ක මුදලක් ද,වැවිලි සමාගම් අංශයේ එක් ගසකට රු.35ක් මුදලක් ද වශයෙන් සහනාධාර ලබා දේ.

වැසි ආවරණ යෙදීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් කුඩා වතු අංශය සඳහා හෙක්.800 ක් ද, වැවිලි සමාගම් අංශය සඳහා හෙක්.2,500ක් වශයෙන් හඳුනා ගත් ඉලක්කවලට අනුව ළඟා කර ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

වැසි ආවරණ යෙදීම - 2022 (කුඩා වතු අංශය)

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.)	වැසි ආවරණ යෙදූ ගස් සංඛ්‍යාව	වැසි ආවරණ යෙදූ ගොවීන් සංඛ්‍යාව	සහනාධාර වශයෙන් ගෙවූ මුදල (රු.මි.)
රත්නපුර	170	208.82	79,673	125	5.83
කොළඹ	80	61.49	23,847	39	1.56
ගාල්ල	35	18.56	7,430	5	0.52
මාතර	35	53.82	21,537	25	1.50
කෑගල්ල	330	308.10	123,241	179	8.38
ගම්පහ	20	25.67	10,268	13	0.72
කුරුණෑගල	20	39.49	15,797	26	1.11
මහනුවර	10	4.34	1,734	6	0.12
කළුතර	100	96.62	38,179	67	2.67
එකතුව	**800**	**816.92**	**321,706**	**485**	**22.41**

වගු අංක IX

වැවිලි සමාගම් විසින් 2022 වසරේ දී රබර් වගාව සඳහා වැසි ආවරණ යෙදීම පිළිබඳ තොරතුරු පහත වගුව තුළින් නිරූපණය වේ.

වැසි ආවරණ යෙදීම - 2022 (වැවිලි සමාගම)

වැවිලි සමාගමේ නම	වැසි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.)	වැසි ආවරණ යෙදූ ගස් ගණන	සහනාධාර වශයෙන් ගෙවූ මුදල (රු.මි.)
අගලවත්ත වැවිලි සමාගම	210.62	71,210	2.49
පුස්සැල්ලාව වැවිලි සමාගම	455.01	164,575	5.76
බලංගොඩ වැවිලි සමාගම	155.82	44,900	1.57
කහවත්ත වැවිලි සමාගම	227.00	64,012	2.24
ලලාන් වැවිලි සමාගම	335.49	137,420	4.81
කෑගල්ල වැවිලි සමාගම	251.76	79,981	2.80
කෑලණිවැලි වැවිලි සමාගම	292.96	100,614	3.52
මල්වත්ත වැලි වැවිලි සමාගම	46.32	18,061	0.63
ඇල්කඩුව වැවිලි සමාගම	10.00	3,969	0.14
හොරණ වැවිලි සමාගම	231.60	105,622	3.70
අගලවත්ත වැවිලි සමාගම	302.37	113,825	3.98
නමුණුකුල වැවිලි සමාගම	98.69	37,521	1.31
රබර් පර්යේෂණ ආයතනය	66.63	22,282	0.78
ඇල්පිටිය වැවිලි සමාගම	64.91	25,973	0.91
තලවාකැලේ වැවිලි සමාගම	7.89	3,157	0.11
මතුරට වැවිලි සමාගම	16.77	6,708	0.23
එකතුව	**2,773.84**	**999,830**	**34.98**

වගු අංක X

ඉහත තොරතුරු අනුව 2022 වසරේ වැසි ආවරණ යෙදීම සඳහා දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් හෙක්.3,300ක ඉලක්කයට අනුව හෙක්. 3,591 ක වැසි ආවරණ යොදා ඇති බව පැහැදිලි වේ.

2.5. අතුරු භෝග වගාව

රබර් ශාකයක් සිටුවා අස්වැන්න ලබා ගැනීමට වසර 6 හෝ 7ක කාලයක් ගත වන බැවින් එම කාලය තුළ වගාකරුවන්ට යම් අතුරු ආදායමක් ලබා ගැනීම සඳහා **අතුරු භෝග වගා ක්‍රමය** හඳුන්වා දී ඇත. ඒ අනුව අන්නාසි, කෙසෙල්, වැල් දොඩම්, ගස්ලබු, කොකෝවා, මිරිස්, ඉඟුරු, පුවක්, කුරුඳු, ලූණු, මුං ඇට, කවුපි, උඳු, තල, කුරක්කන්, එනසාල්, සාදික්කා, ගම්මිරිස්, එළවළු වර්ග, බඩඉරිඟු වැනි වගාවන් මෙහිදී සිදු කෙරේ. රබර් පර්යේෂණායතනයේ නිර්දේශිත ප්‍රාකාරව සාර්ථකව වගා කරන ලද අතුරු භෝග සහිත රබර් වගාවක් සඳහා අක්කරයකට රු. 4,000/- ක සහනාධාර මුදලක් දෙපාර්තමේන්තුව මඟින් සහනාධාර ලෙස ලබා දෙනු ලැබේ.

2022 වර්ෂයේ අතුරු භෝග වගාව

දිස්ත්‍රික්කය	ඉලක්කය (හෙක්.)	වගා කළ භෝග වර්ගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	වගා කළ ගොවීන් සංඛ්‍යාව
රත්නපුර	35	එළවළු	1.69	5
		අන්නාසි	5.96	6
		කෙසෙල්	4.17	12
		කහ	0.45	1
		කුරුඳු	1.21	2
		කන්න භෝග	0.40	1
		ගම්මිරිස්	0.78	3
කොළඹ		අන්නාසි	17.49	15
		කෙසෙල්	0.17	1
			32.33	**46**
කෑගල්ල	110	කෙසෙල්	28.77	56
		අන්නාසි	30.82	44
		කහ/මිරිස්/කුරුඳු/පුවක්/ඉඟුරු/බුලත්/ගම්මිරිස්	6.64	11
		ලුණු/එළවළු	8.81	21
ගම්පහ		කෙසෙල්	0.80	1
		අන්නාසි	13.58	24
කුරුණෑගල		කෙසෙල්	10.81	7
		කහ/මිරිස්/කුරුඳු/පුවක්/ඉඟුරු/බුලත්/ගම්මිරිස්	0.81	2
මහනුවර		කෙසෙල්	4.62	11
මාතලේ		තල/උඳු/කුරක්කන්	4.86	10
අනුරාධපුර		අන්නාසි	0.20	1
		තල/උඳු/කුරක්කන්	4.66	8
		පැෂන්	0.60	1
			115.98	**197**
මොනරාගල	70	කෙසෙල්	7.26	22
		කන්න භෝග	66.59	100
බදුල්ල		කෙසෙල්	1.20	3
			75.05	**125**
ගාල්ල	15	කෙසෙල්	1.42	2
මාතර		අන්නාසි	1.34	6
		කෙසෙල්	2.55	7
		කන්න භෝග	0.16	2
		එළවළු	0.03	1
හම්බන්තොට		කෙසෙල්	1.79	5
		කන්න භෝග	10.39	16
			17.67	**39**
කළුතර	20	අන්නාසි	9.29	28
		කෙසෙල්	4.70	
		එළවළු	0.40	
		මිශ්‍ර	2.89	
			17.28	**28**
එකතුව	**250**		**258.31**	**435**

2.6. රබර් වගාව ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම

2.6.1. කිරි කැපුම් ශිල්පී පුහුණුව - සාමාන්‍ය/වෘත්තීය

රබර් වගාවේ ඵලදාව නිවැරදිව ලබා ගැනීම සඳහාත්, එම ඵලදාව දීර්ඝ කාලීනව ලබා ගැනීමටත් තාක්ෂණයට අනුව කිරි කැපීම් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ක්ෂේත්‍රය තුළ එවැනි කිරි කපන්නන් සුලභ කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය/වෘත්තීය පුහුණුව ලබා දේ.

කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන (සාමාන්‍ය)-2022

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ සංඛ්‍යාව	වැය කළ මුදල (රු.)
රත්නපුර	**90**	**5**	**90**	**150,800.00**
කෑගල්ල	**130**	**7**	**130**	**225,365.00**
මොණරාගල	**60**	**9**	**90**	**155,970.00**
කළුතර	**90**	**5**	**90**	**135,320.00**
ගාල්ල	**30**	**3**	**33**	**51,200.00**
එකතුව	**400**	**29**	**433**	**718,655.00**

වගු අංක XII

කිරි කැපුම් ශිල්පී පුහුණුව වැඩසටහන (වෘත්තීය) - 2022

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ සංඛ්‍යාව	වැය කළ මුදල (රු.)
රත්නපුර	**20**	**1**	**20**	**114,650.00**
කෑගල්ල	**50**	**2**	**55**	**347,220.00**
මොණරාගල	**20**	**1**	**20**	**131,540.00**
කළුතර	**40**	**2**	**40**	**206,250.00**
ගාල්ල	**20**	**1**	**20**	**139,100.00**
එකතුව	**150**	**7**	**155**	**938,760.00**

වගු අංක XIII

2.6.2. බද්ධකරුවන් පුහුණු වැඩසටහන

ගුණාත්මක බවින් ඉහළ සාර්ථක බද්ධ රබර් පැළයක් නිෂ්පාදනය සඳහා විධිමත් ක්‍රමානුකූල දැනුමක් සහිත බද්ධකරුවෙකුගේ සහාය අවශ්‍ය වේ. ඒ අනුව, පැළ බද්ධ කිරීමේ කාර්යයේ නියුතු පුද්ගලික පැළ තවාන්කරුවන්, රජයේ පැළ තවාන්වල සේවකයින් මෙන්ම පැළ බද්ධ කිරීමේ කාර්යය සඳහා යොමු වීමට කැමැත්තක් දක්වන ආධුනිකයින් මෙම පුහුණු වැඩසටහන සඳහා තෝරා ගැනේ.

බද්ධකරුවන් පුහුණුව- 2022

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කළ සංඛ්‍යාව	වැය කළ මුදල (රු.මී)
කළුතර	60	2	36	29,110.00
ගාල්ල		1	23	8,220.00
එකතුව	**60**	**3**	**59**	**37,330.00**

වගු අංක XIV

2.6.3. වැසි ආවරණ යෙදීමට පුහුණු කිරීමේ වැඩසටහන

වර්ෂාව නිසා කිරි අස්වනු නෙලීම වසර පුරා වරින් වර අඩාල වීම වැළැක්වීමට ආවරණ යෙදීමේ ක්‍රමවේදය හඳුන්වා දීම සඳහා වැසි ආවරණ යෙදීමේ පුහුණු වැඩසටහන පවත්වනු ලැබේ. රබර් ගසට හෝ කිරි අස්වැන්නට හානි නොවන පරිදි වැසි ආවරණ යෙදීමේ ක්‍රමවේදය වගාකරුවන්ට හා ශ්‍රමිකයන්ට හඳුන්වා දීම මෙම වැඩසටහනේ පරමාර්ථය වේ.

වැසි ආවරණ යෙදීමේ පුහුණුව- 2022

ප්‍රාදේශීය කාර්යාලය	**ඉලක්කය (පුද්ගලයින්)**	**පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව**	**පුහුණු කල සංඛ්‍යාව**	**වැය කළ මුදල (රු.)**
රත්නපුර	**60**	**3**	**71**	**48,745.00**
කෑගල්ල	**90**	**5**	**90**	**88,995.00**
කළුතර	**60**	**3**	**71**	**28,198.00**
ගාල්ල	**40**	**11**	**63**	**40,000.00**
එකතුව	**250**	**22**	**295**	**205,938.00**

වගු අංක XV

2.6.4. රබර් වගාවේ රෝග පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන

රබර් වගාවේ බහුලව වාර්තා වන රෝග සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කර, රබර් වගාවට වැළඳෙන රෝග පාලනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

රබර් රෝග පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන-2022

ප්‍රාදේශීය කාර්යාලය	ඉලක්කය (පුද්ගලයින්)	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	පුහුණු කල සංඛ්‍යාව	වැය කළ මුදල (රු.)
රත්නපුර	**50**	**2**	**58**	**43,352.00**
කෑගල්ල	**90**	**6**	**120**	**79,490.00**
මොණරාගල	**40**	**4**	**40**	**35,200.00**
කළුතර	**50**	**3**	**58**	**26,660.00**
ගාල්ල	**20**	**3**	**32**	**16,110.00**
එකතුව	**250**	**18**	**308**	**200,812.00**

වගු අංක XVI

ඉහත පුහුණු වැඩසටහන්වලට අමතරව,රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ පුහුණුව, ආදර්ශ ගොවිපළ ඒකක ඇති කිරීම, රබර් ෂීට් නිෂ්පාදන පුහුණුව, රබර් වගාව පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුව වැනි පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කර ඇත.

2.7. 2022 අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

වාර්ෂික අයවැය කථාව මඟින් වෙන් වූ ප්‍රතිපාදන යටතේ වූ ප්‍රධාන ව්‍යාපෘතිය යටතේ වන උප ව්‍යාපෘති 05ක් 2022 වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය:

- **ජාත්‍යන්තර වෙළඳපොළ ජයගැනීම උදෙසා නූතන තාක්ෂණයෙන් පෝෂිත අඟය එකතු කිරීමක් සහිත වැවිලි භෝග ක්ෂේත්‍රයක් ගොඩනැඟීම සහ අපනයන වෙළඳපොළ උපක්‍රමශීලීව ජය ගැනීමට පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම.**

වැඩසටහන/ව්‍යාපෘතිය	ඉලක්කය (ඒකක)	නිම කර ඇති (ඒකක)	අනුමත ප්‍රතිපාදන රු.මි.	වැය කළ මුදල රු.මි.
ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය සඳහා සැකසුම් මධ්‍යස්ථාන 168ක් ස්ථාපනය කිරීම	168	168	13.680	13.673
රබර් වගාව සඳහා ජල සම්පාදන ඒකක 32ක් ස්ථාපනය	32	32	3.282	3.248
පත්‍ර පතන රෝග පාලනය (යන්ත්‍ර)	15	15	14.150	14.148
රබර් පැල තවාන්හි යටිතල පහසුකම් සංවර්ධනය	1	1	0.617	0.616
කුඩා රබර් වතු හිමියන්ගේ ආර්ථික ශක්තිය නැංවීම	16	16	0.624	0.544
එකතුව			**32.353**	**32.229**

වගු අංක XVII

2.8. කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක උප ව්‍යාපෘති (Smallholder Tea and Rubber Revitalization Project (STaRR)

කෘෂිකර්මාන්තය සඳහා වන අන්තර්ජාතික අරමුදලේ (IFAD) හා ශ්‍රී ලංකා රජයේ මූල්‍ය දායකත්වය යටතේ, ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම ඉහළ නැංවීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ අරමුණින්, 2016 දී **කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය** ආරම්භ කර ඇත.

මොනරාගල හා අම්පාර දිස්ත්‍රික්ක වැනි සාම්ප්‍රදායිකව රබර් වගා නොකරන ප්‍රදේශවල වගාකරුවන්ට නව වගාව සඳහා සහනාධාර ලබාදීමත්, රජයේ පැළ තවාන් වන පදියතලාව හා කුඹුක්කන රබර් පැළ තවාන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මූල්‍ය ආධාර ලබාදීමත්, කුඩා තේ හා රබර් වතුවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මූල්‍ය ආධාර ලබාදීමත් මෙම ව්‍යාපෘතිය තුළින් සිදු කර ඇත.

ඒ අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ රජයේ තවාන් වන පදියතලාව හා කුඹුක්කන රබර් පැළ තවාන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සිදු කළ උප ව්‍යාපෘති පහත වගුවේ දැක්වේ.

	වැඩසටහන/ ව්‍යාපෘතිය	ඇස්තමේන්තු මුදල (රු.)	වැය කළ මුදල(රු.)	භෞතික ප්‍රගතිය
පදියතලාව තවාන				
	පතහ සංවර්ධනය කිරීම	2,000,000.00	1,949,507.25	100%
	සේවක විවේකාගාරය ඉදි කිරීම	1,000,000.00	1,000,000.00	100%
	දැල් ගෘහයක් ඉදි කිරීම	1,000,000.00	970,125.00	100%
	තවාන් උපකරණ මිලදී ගැනීම	500,000.00	500,000.00	100%
කුඹුක්කන තවාන				
	සේවක විවේකාගාරය ඉදි කිරීම	7,000,000.00	557,500.00	ක්‍රියාත්මක කරමින් පවතී.
	තවාන් උපකරණ මිලදී ගැනීම	500,000.00	496,545.00	100%
	තවාන් කාර්යාලය අලුත්වැඩියා කිරීම	1,000,000.00	620,725.00	ක්‍රියාත්මක කරමින් පවතී.
	තවාන් කාර්යාලය සඳහා ප්‍රින්ටරයක් මිලදී ගැනීම	100,000.00	58,000.00	100%
	පිවිසුම් මාර්ගයේ පාලම අලුත්වැඩියා කිරීම	6,500,000.00	-	ක්‍රියාත්මක කරමින් පවතී.

වගු අංක XVIII

2.9. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු- 2022

2.9.1. රබර් වගා බිම් ප්‍රමාණය

2010 වසරේ දිවයිනම ආවරණය වන පරිදි සිදු කරන ලද රබර් ඉඩම් සංගණනයේ දත්ත මත පදනම්ව වාර්ෂිකව සිදු කරනු ලබන නව වගා ප්‍රමාණය හා වගාවෙන් ඉවත් වන ඉඩම් ප්‍රමාණය අනුව 2022 වසරේ ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත රබර් ඉඩම් ප්‍රමාණය ගණනය කර ඇත.

රබර් ඉඩම් ප්‍රමාණය (2022)

වර්ෂය	ඇස්තමේන්තුගත බිම් ප්‍රමාණය (හෙක්.)		
	කුඩා වතු අංශය	**ප්‍රාදේශීය වැවිලි සමාගම්/රාජ්‍ය වතු**	**එකතුව**
2022	**94,198**	**44,328**	**138,526**

වගු අංක XIX

2022 වසරේ රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 70,867 කි. එම අගය 2021 වසර හා සැසඳීමේදී මෙට්‍රික් ටොන් 6,017කින් පහළ යාමකි. 2022 වසරේ මැද භාගයේ රබර් මිලෙහි ශීඝ්‍ර ලෙස පහළ යාමත් අධික වර්ෂාව පැවතීමත්, පත්‍ර පතන රෝගය වගා භූමි තුළ බහුලව පැවතීමත් නිෂ්පාදනය පහළ යාම සඳහා හේතු වී ඇත.

ලෝක රබර් නිෂ්පාදනය - 2022 (මෙට්‍රික් ටොන් දහස්)

රට	රබර් නිෂ්පාදනය 2021	රබර් නිෂ්පාදනය 2022
තායිලන්තය	4,836	4,799
ඉන්දුනීසියාව	3,045	3,135
වියට්නාමය	1,260	1,236
චීනය	851	853
ඉන්දියාව	757	830
මැලේසියාව	470	394
කාම්බෝජය	368	382
මියන්මාරය	290	300
බංගලාදේශය	22	23
පැපුවා නිව්ගිනියා	6	6
පිලිපීනය	172	180
ශ්‍රී ලංකාව	77	70
අනෙකුත් රටවල්	1,953	2,136
ලෝක නිෂ්පාදනය	**14,107**	**14,344**

වගු අංක XX

මූලාශ්‍රය- ස්වාභාවික රබර් නිෂ්පාදනය කරන රටවල සංගමයේ (ANRPC) දත්ත ඇසුරෙන්

ඉහත වගුවට අනුව 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වසරේ ලෝක රබර් නිෂ්පාදනය මෙ.ටො.දහස් 237 කින් වැඩි වී ඇත. 2021 වර්ෂයේ මෙන්ම 2022 වර්ෂයේදී ද වැඩිම රබර් නිෂ්පාදනයක් සිදු කර ඇත්තේ අග්නිදිග ආසියාතික රටක් වන තායිලන්තය වේ.

2.9.2. රබර් නිෂ්පාදන වියදම

රබර් නිෂ්පාදන වියදම 2021 – 2022 (කි.ග්‍රෑම් 1 ක් /රුපියල්)

වර්ෂය	වැවිලි සමාගම්	කුඩා වතු අංශය
2021	364.91	221.00
2022	369.43	288.00

වගු අංක XXI

2.9.3. ස්වාභාවික රබර් අපනයනය

2021 වර්ෂය සමඟ සසඳන විට 2022 වර්ෂයේදී ලංකාවේ රබර් අපනයනයේ සුළු අඩුවීමක් සිදු වී ඇත. එනම්, 2021 වර්ෂයේ ස්වාභාවික රබර් මෙ.ටො. 15,490ක්ව පැවති අපනයනය ප්‍රමාණය 2022 වර්ෂයේ මෙ.ටො. 15,138ක් දක්වා පහළ යාමකි.

2.9.4. ශ්‍රී ලංකාවේ සමස්ත රබර් අපනයනය

ශ්‍රී ලංකාවේ රබර් අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛනවලට අනුව 2022 වසරේදී සමස්ත රබර් අපනයන ආදායම ලෙස රු.මි. 327,277 ක් ලබමින් ඩොලර් බිලියන 01ක වටිනාකමක් දේශීය ආර්ථිකයට එකතු කිරීමට රබර් අංශයට හැකියාව ලැබී ඇත.

මුළු රබර් අපනයන ප්‍රමාණය සහ අපනයන ආදායම - 2022

වර්ගය	අපනයනය කළ ප්‍රමාණය	අපනයනය ආදායම (රු.මි.)
ස්වාභාවික රබර් (කි.ග්‍රෑම්)	15,138,244	12,742
කෘත්‍රිම රබර් (කි.ග්‍රෑම්)	25,370	6
අර්ධ නිමි රබර් (කි.ග්‍රෑම්)	7,244,429	957
නිමි භාණ්ඩ (කි.ග්‍රෑම්)	58,548,690	121,207
නිමි භාණ්ඩ (ඒකක)	34,845,001	192,365
සමස්ත රබර් අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑම්)	80,956,733	134,912
සමස්ත රබර් අපනයන ප්‍රමාණය (ඒකක)	34,845,001	192,365
එකතුව		**327,277**

වගු අංක XXII

2.9.5. සමස්ත රබර් අපනයන ආදායම -2022 (රටවල් අනුව)

රට	අපනයන ආදායම (රු. මී)	ප්‍රතිශතය %
ඇමෙරිකා එක්සත් ජනපදය	103,639.43	31.67
ජර්මනිය	32,532.24	9.94
බෙල්ජියම	17,786.07	5.44
ඉතාලිය	15,925.41	4.87
කැනඩාව	10,912.10	3.34
ප්‍රංශය	10,533.07	3.22
එක්සත් රාජධානිය	10,156.34	3.10
ඕස්ට්‍රේලියාව	9,864.51	3.01
ඉන්දියාව	9,568.48	2.92
බ්‍රසීලය	9,308.09	2.84
අනෙකුත් රටවල්	97,051.35	29.65
සමස්ත රබර් අපනයනය ආදායම	**327,277.09**	**100.00**

වගු අංක XXIII

ශ්‍රී ලංකාවේ ස්වාභාවික රබර් මිලදී ගත් ප්‍රධාන රටවල් 2022

රට	මිලදී ගත් ප්‍රමාණය (මෙ.ටො.)	ප්‍රතිශතය %
පාකිස්තානය	5,490	36%
ජපානය	1,555	10%
චීනය	1,120	7%
ජර්මනිය	970	6%
මැලේසියාව	835	6%
ඉතාලිය	793	5%
වියට්නාමය	653	4%
ඉන්දියාව	583	4%
දකුණු අප්‍රිකාව	433	3%
ඇමෙරිකා එක්සත් ජනපදය	424	3%
අනෙකුත් රටවල්	2,282	16%
එකතුව	**15,138**	**100%**

වගු අංක XXIV

2.9.6. ස්වාභාවික රබර් ආනයනය

2022 වර්ෂය තුළ ස්වාභාවික රබර් මෙට්‍රික් ටොන් 64,459.4ක් ආනයනය කර ඇති අතර එම අගය 2021 වර්ෂයේ ආනයනය කළ ප්‍රමාණය මෙ.ටො. 72,068.2 ක ප්‍රමාණයකට සාපේක්ෂව 11%ක අඩු වීමකි.

මුළු රබර් ආනයනය - 2022

වර්ගය	ආනයනය කළ ප්‍රමාණය	ආනයන වියදම (රු.මි.)
ස්වාභාවික රබර් (කි.ග්‍රෑම්)	64,459,380	38,991.63
කෘත්‍රිම රබර් (කි.ග්‍රෑම්)	60,753,584	43,772.69
අර්ධ නිමි රබර් (කි.ග්‍රෑම්)	46,384,215	15,016.67
නිමි හාණ්ඩ (කි.ග්‍රෑම්)	7,271,398	14,416.16
නිමි හාණ්ඩ (ඒකක)	2,851,403	13,666.07
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (කි.ග්‍රෑම්)	178,868,577	112,197.15
සමස්ත රබර් ආනයන ප්‍රමාණය (ඒකක)	2,851,403	13,666.07
එකතුව		**125,863.22**

වගු අංක XXV

2021 වර්ෂයට සාපේක්ෂව 2022 වසරේ ආනයන ප්‍රමාණය අඩුවුව ද, 2022 වසරේ ආනයන වියදමේ සැළකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. එනම්, 2021 වසරේ පැවති රු.මි.101,046 ක ආනයන වියදම 2022 වසරේ දී රු.මි. 125,863ක් දක්වා වැඩි වීමකි.

රටවල් අනුව ස්වභාවික රබර් ආනයනය කළ ප්‍රමාණයන්-2022

රට	ආනයනය කළ ප්‍රමාණය(මෙ.ටො.)	ප්‍රතිශතය (%)
තායිලන්තය	26,258	40.74
වියට්නාමය	18,217	28.26
ඉන්දුනීසියාව	14,793	22.95
අයිවරි කෝස්ට්	1,855	2.88
මැලේසියාව	1,070	1.66
ඉන්දියාව	829	1.29
සිංගප්පුරුව	487	0.76
එක්සත් රාජධානිය	363	0.56
මියන්මාරය	202	0.31
ස්පාඤ්ඤය	202	0.31
අනෙකුත් රටවල්	183	0.28
එකතුව	**64,459**	**100%**

වගු අංක XXVI

2.9.7. සමස්ත රබර් ආනයනය (රටවල් අනුව)- 2022

රට	ආනයන වියදම (රු.මී)	ප්‍රතිශතය (%)
තායිලන්තය	20,206	16.05
ඉන්දියාව	14,046	11.16
චීනය	11,360	9.03
වියට්නාමය	11,167	8.87
දකුණු කොරියාව	10,779	8.56
මැලේසියාව	10,497	8.34
ඉන්දුනීසියාව	10,113	8.04
ජපානය	8,873	7.05
තායිවානය	5,655	4.49
බ්‍රසීලිය	5,029	4.00
අනෙකුත් රටවල්	18,138	14.41
එකතුව	**125,863**	**100**

වගු අංක XXVII

2.9.8. රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍ය

රබර් වෙළඳුන් විසින් ගොවීන්ගෙන් රබර් ලබාගත් මිලෙහි මාසික සාමාන්‍යය (Farm Gate Price) 2022							
මාසය	**ෂීට් රබර් (ආර්.එස්.එස්)**					**ලේටෙක්ස් (රබර් කිරි)**	**ඔට්ටපාලු**
	1	**2**	**3**	**4**	**5**		
ජනවාරි	477.44	459.29	448.56	434.27	317.94	434.18	239.96
පෙබරවාරි	444.77	427.24	421.72	414.62	415.92	427.86	222.53
මාර්තු	507.53	496.27	480.54	477.36	470.79	433.61	237.28
අප්‍රේල්	613.56	485.22	475.18	587.17	587.90	420.49	274.34
මැයි	647.89	640.86	622.30	626.99	626.20	589.20	294.65
ජූනි	685.11	677.38	671.15	661.32	658.25	647.63	312.91
ජූලි	693.49	687.74	671.78	657.84	655.67	697.81	321.93
අගෝස්තු	689.84	683.02	670.13	654.34	653.64	696.35	309.87
සැප්තැම්බර්	620.16	613.71	579.78	571.15	566.40	599.31	251.76
ඔක්තෝබර්	476.61	492.15	453.61	451.95	447.70	493.24	181.33
නොවැම්බර්	492.90	486.08	476.46	474.11	473.54	409.09	199.98
දෙසැම්බර්	472.20	465.87	457.30	455.36	454.81	421.53	202.42
සාමාන්‍ය අගය	**568.46**	**551.24**	**535.71**	**538.87**	**527.40**	**522.53**	**254.08**

වගු අංක XXVIII

කොළඹ රබර් වෙන්දේසියේ රබර් වර්ගවල සාමාන්‍ය මිල මාසිකව - 2022

මාසය	ෂීට් රබර් (ආර්.එස්.එස්)					ලේටෙක්ස් ක්‍රේප්					ස්ක්‍රෑප් ක්‍රේප්					
	1	2	3	4	5	1X	1	2	3	4	1XBR	2XBR	3XBR	No.4	F.B.	SKIM
ජනවාරි	461.00	ඉ. නැත	440.00	430.00	ඉ. නැත	652.25	651.50	585.00	512.50	411.25	398.75	392.50	394.67	386.33	380.00	**385.50**
පෙබරවාරි	458.50	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	701.23	698.25	667.50	619.50	455.75	399.25	388.50	384.88	380.13	ඉ. නැත	**390.00**
මාර්තු	562.70	594.33	503.00	ඉ. නැත	ඉ. නැත	803.60	797.00	765.00	722.00	545.00	459.50	450.00	399.50	430.00	410.00	**438.80**
අප්‍රේල්	648.75	639.00	629.00	610.00	ඉ. නැත	953.33	937.50	882.50	790.00	598.75	538.25	515.00	533.50	505.00	ඉ. නැත	**485.00**
මැයි	718.33	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	1162.50	1153.75	1066.25	916.25	661.25	551.75	548.33	554.25	535.00	523.50	**541.42**
ජූනි	800.80	ඉ. නැත	743.00	710.00	ඉ. නැත	1400.00	1391.67	1308.75	1143.75	732.50	675.00	663.00	607.67	588.33	567.50	**633.00**
ජූලි	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	1450.00	1248.33	1095.00	930.00	680.75	643.25	645.00	619.06	603.75	ඉ. නැත	**655.50**
අගෝස්තු	685..00	ඉ. නැත	660.00	ඉ. නැත	ඉ. නැත	987.50	987.50	874.00	694.00	558.60	529.00	515.00	559.50	540.00	ඉ. නැත	**521.75**
සැප්.	670.00	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	ඉ. නැත	813.00	805.00	733.33	656.25	480.75	451.25	405.00	443.00	433.00	ඉ. නැත	**435.00**
ඔක්.	500.00	495.20	489.50	473.00	456.50	675.00	675.00	585.00	513.75	454.50	412.50	407.67	401.67	389.33	400.00	**358.33**
නොවැ.	526.70	520.10	515.00	480.00	ඉ. නැත	612.50	609.00	543.50	510.00	499.00	446.25	432.20	427.80	423.75	425.00	**343.40**
දෙසැම්බර්	517.67	505.00	473.00	473.00	457.50	628.33	626.33	527.50	473.25	462.75	445.25	441.33	441.10	434.33	430.00	**366.51**
සාමාන්‍ය	595.40	550.73	556.56	529.33	457.00	903.27	881.74	802.78	706.77	545.07	495.83	483.63	480.55	470.75	448.00	**462.85**

අන්තර් ජාතික රබර් මිල (2017-2022)

වර්ෂය	ශ්‍රී ලංකා රුපියල්			
	කොළඹ වෙන්දේසි මිල(රු.) (RSS 3)	බැංකොක් වෙන්දේසි මිල(රු.) (RSS 3)	කොට්ටයාම් වෙන්දේසි මිල(රු.) (RSS 4)	සයිකොම් වෙන්දේසි මිල(රු.) (RSS 3)
2017	324.50	311.69	322.75	307.70
2018	263.11	257.00	301.80	256.01
2019	272.43	296.90	343.08	297.05
2020	318.86	327.01	339.82	322.17
2021	435.52	389.13	443.64	416.54
2022	556.56	619.89	676.16	585.65

වගු අංක XXX

2.10. බලපත්‍රලාභී රබර් වෙළඳුන් පිළිබඳ තොරතුරු

2022 වසරේදී දිස්ත්‍රික්ක වශයෙන් රබර් වෙළඳුන් වෙත රබර් මිලදී ගැනීම සඳහා බලපත්‍ර ලබා දුන් ආකාරය පහත පරිදි වේ.

දිස්ත්‍රික්කය	**අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව**	**නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව**	**එකතුව**
රත්නපුර	122	5	127
කොළඹ	32	1	33
මොනරාගල	35	4	39
බදුල්ල	2	0	2
අම්පාර	2	0	2
ගාල්ල	27	1	28
මාතර	28	1	29
හම්බන්තොට	1	0	1
කෑගල්ල	147	11	158
ගම්පහ	26	2	28
කුරුණෑගල	6	0	6
මහනුවර	9	0	9
මාතලේ	1	0	1
කළුතර	129	10	139
එකතුව	**567**	**35**	**602**

වගු අංක XXXI

2.11. ඒකාබද්ධ අරමුදල

වියදම් විෂය		වෙන්කළ ප්‍රතිපාදනය (රු.)	2022.12.31දිනට ශුද්ධ වියදම (රු.)
<u>පුනරාවර්තන වියදම්</u>			
වැටුප් හා වේතන	1001	185,000,000.00	173,321,955.66
අතිකාල හා නිවාඩු දින වැටුප්	1002	4,000,000.00	3,794,032.36
වෙනත් දීමනා	1003	90,000,000.00	79,590,143.27
ගමන් වියදම් - දේශීය	1101	11,500,000.00	11,395,665.95
ගමන් වියදම් - විදේශීය	1102	-	-
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	1201	5,250,000.00	5,142,895.99
ඉන්ධන	1202	11,000,000.00	10,627,766.46
ආහාරපාන සහ නිල ඇඳුම්	1203	600,000.00	575,135.83
වෙනත් සැපයුම්	1205	500,000.00	486,674.00
වාහන නඩත්තු	1301	8,500,000.00	8,350,014.34
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු	1302	850,000.00	840,071.40
ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු	1303	500,000.00	484,396.31
තැපැල් සහ සන්නිවේදන	1402	6,000,000.00	5,443,302.93
විදුලිය සහ ජලය	1403	1,600,000.00	1,566,700.28
බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු	1404	40,500,000.00	39,489,167.45
මෙහෙයුම් කල්බදු වාහන සඳහා වාරික ගෙවීම්	1408	9,485,000.00	7,172,000.00
වෙනත්(පිරිසිදු කිරීම්/ආරක්ෂක සේවා)	1409	10,000,000.00	9,723,201.19
සංවර්ධන සහනාධාර	1504	-	-
සම්මාදම් සහ දායක මුදල්	1505	10,800,000.00	-
රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී	1506	1,900,000.00	1,848,218.28
පාඩු හා කපා හැරීම්	1701	15,000.00	14,580.00
එකතුව (පුනරාවර්තන වියදම්)		**398,000,000.00**	**359,865,921.70**
<u>මූලධන වියදම්</u>			
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2001	5,000,000.00	4,432,106.86
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2002	1,000,000.00	986,887.77
නඩත්තු හා වැඩිදියුණු කිරීම්-වාහන	2003	4,000,000.00	3,874,071.72
ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2102	-	-
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2103	-	-
ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2104	-	-
මෘදුකාංග සංවර්ධනය	2106	-	-
කාර්ය මණ්ඩල පුහුණු	2401	1,000,000.00	975,775.60
සංවර්ධන සහායන්	2202	700,000,000.00	652,140,101.28
පර්යේෂණ සහ සංවර්ධන	2507	5,000,000.00	4,403,336.00
එකතුව (මූලධන වියදම්)		**716,000,000.00**	**666,812,279.23**
එකතුව (සම්පූර්ණ)		**1,114,000,000.00**	**1,026,678,200.93**

වගු අංක XXXII

2.12. සෙස් බදු අය කිරීම.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝගවලට අනුව ශ්‍රී ලංකාව තුළ රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන්ගෙන් එම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය වශයෙන් මිල දී ගන්නා ස්වාභාවික රබර් සඳහා මිලදී ගනු ලබන අමු රබර් කි.ග්‍රෑ 1 ක් සඳහා රු. 4/- බැගින් සෙස් බදු අය කරනු ලැබේ. ඒ අනුව 2022 වසරේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සෙස් බදු අය කිරීම පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

සෙස් බදු සඳහා ලියාපදිංචි ආයතන විස්තරය - 2022

2022 වර්ෂය සඳහා ලියාපදිංචි රබර් ආශ්‍රිත නිෂ්පාදන ආයතන සංඛ්‍යාව - 151

සෙස් බදු ගෙවූ ආයතන සංඛ්‍යාව - 60

දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2022

මාසය	දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	12.31
පෙබරවාරි	19.61
මාර්තු	30.21
අප්‍රේල්	15.56
මැයි	11.64
ජුනි	12.50
ජූලි	19.12
අගෝස්තු	17.59
සැප්තැම්බර්	34.10
ඔක්තෝබර්	11.46
නොවැම්බර්	9.40
දෙසැම්බර්	20.37
එකතුව	**213.87**

වගු අංක XXXIII

සෙස් බදු නියෝගවලට අනුව රබර් ආනයනය හා අපනයනය මත ශ්‍රී ලංකා රේගුව මඟින් 2022 වසරේ අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

අපනයනය හා ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය මාසිකව– 2022

මාසය	ආනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)	අපනයනය මත අය කළ සෙස් බදු ප්‍රමාණය (රු.මි)
ජනවාරි	371.75	7.47
පෙබරවාරි	301.95	7.10
මාර්තු	237.02	7.53
අප්‍රේල්	201.67	5.92
මැයි	126.88	4.51
ජුනි	179.27	4.65
ජූලි	145.47	4.41
අගෝස්තු	273.82	4.53
සැප්තැම්බර්	185.53	5.53
ඔක්තෝබර්	326.62	6.13
නොවැම්බර්	497.56	4.34
දෙසැම්බර්	368.02	5.53
එකතුව	**3,215.56**	**67.65**

වගු අංක XXXIV

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධනය

ඒසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	තත්‍ය 2022 රු.	තත්‍ය 2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		722,250,000	870,420,000	ඒසිඒ -3
-	තැන්පතු		91,214,920	120,498,664	ඒසිඒ -4
-	අත්තිකාරම් ගිණුම්		23,452,751	20,956,392	ඒසිඒ -5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**836,917,671**	**1,011,875,056**	
-	මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)		**836,917,671**	**1,011,875,056**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)				
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ) – (ඇ)		**836,917,671**	**1,011,875,056**	
	අඩු කලා- වියදම්				
	පුනරාවර්තන වියදම්		-		
282,000,000	වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	256,706,131	246,567,049	ඒසිඒ 2(ii)
102,700,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	101,296,992	100,242,823	
13,300,000	සහනාධාර, ප්‍රදාන හා මාරු කිරීම්	7	1,848,218	2,619,150	
	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	14,580	-	
398,000,000	මුළු පුනරාවර්තන වියදම්(ඊ)		**359,865,921**	**349,429,022**	

	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
10,000,000	වැඩිදියුණු කිරීම්	10	9,293,066	10,076,925	
-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11		2,402,761	
700,000,000	ප්‍රාග්ධන මාරු කිරීම්	12	652,140,101	896,807,914	ඒසිඒ-2 (ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	975,776	1,056,017	
5,000,000	වෙනත් මූලධන වියදම්	15	4,403,336	5,835,193	
716,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**666,812,279**	**916,178,810**	
	තැන්පතු ගෙවීම්		90,112,941	121,470,510	ඒසිඒ -4
	අත්තිකාරම් ගෙවීම්		25,072,400	23,155,940	ඒසිඒ -5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		115,185,341	144,626,450	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,141,863,541	1,410,234,282	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		(304,945,870)	(398,359,226)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		304,945,870	(398,359,226)	ඒසිඒ -7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිඒ -3
			-	-	

වගු අංක XXXV

3.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	**අවසාන ප්‍රතිපාදනය**		
පුනරාවර්තන	398,000,000	398,000,000	359,865,921.70	90.41
ප්‍රාග්ධන	716,000,000	716,000,000	666,812,279.23	93.13

වගු අංක XXXVI

3.3. පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

අදාළ නොවේ.

3.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට හාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහය	181,929,111.60	181,929,111.60	-	-
9152	යන්ත්‍රෝපකරණ	232,107,767.07	232,107,767.07	-	-
9153	ඉඩම්	408,370,800.00	408,370,800.00	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	789,006.00	789,006.00	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

වගු අංක XXXVII

3.5. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAL/E/RDD/02/22/03
ඔබේ අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2023 මැයි ෆ දින

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
22 MAY 2023

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
ලැබුණා
22 MAY 2023

ගණන්දීමේ නිලධාරී
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 293- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.3	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 07 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගත වී ඇති සිද්ධීන් 09 ක් සම්බන්ධයෙන් එකතුව රු. 3,159,640 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	වාහන සඳහා වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.110,285,000ක ප්‍රතිපාදනවලින්, සම්මාදම් හා දායක මුදල් (1505) වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදනය වූ රු.10,800,000ක් සම්පූර්ණයෙන්ම වියදම් කර නොතිබුණු අතර මෙහෙයුම් කල්බදු හා වෙනත් දීමනා සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.10,409,857 ක් හා රු.2,313,000ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12ක් හා සියයට 24ක් ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මු. රෙ. 94(1) පරිදි දරන ලද බැරකම් හා වැය ප්‍රමාණය කිසිම විටක වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්ම විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී වැය විෂයන් 03 ක් යටතේ වෙන් කර තිබුණු ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු. 634,867ක බැරකම් වලට බැඳී තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
2022 ජනවාරි 25 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 හි 02 (ආ) ඡේදය	ධාවන තත්ත්වයේ නොපවතින අලුත්වැඩියා කිරීම් ඵලදායි වන වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීම සඳහා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 හි 02 (ආ) මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි එවැනි වාහන අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම කඩිනමින් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහන 03 ක් දෝෂ පැවතීම හා අනතුරට පත්වීම ආදී හේතූන් මත වසර 01 සිට වසර 05 දක්වා කාලයක් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පාඩු හා හානි

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 03 ත් වර්ෂ 08 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 08 ක් සම්බන්ධයෙන් එකතුව රු.3,106,351 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

3.2 අනාර්ථික ගනුදෙනු

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු රු.66,700,000 ක් වටිනා පර්චස් 75ක ඉඩමක් දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ රු.59,304,347 ක් ගෙවා මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මෙම ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණු අතර වසර 13කට වැඩි කාලයක් ගත වූවද මෙම ඉඩමේ කිසිදු ඉදිකිරීමක් සිදුකර නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

(අ) දිස්ත්‍රික්ක 15 ක වගාකරුවන් 32720 ක් සඳහා රබර් නැවත වගාව සහ නව වගාව වෙනුවෙන් ලබාදුන් වගා සහනාධාර මුදලින් වගාව අතහැර දැමීම නිසා වගාකරුවන් 3,327 කගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.113,368,340 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිල නිවාස 69ක නීත්‍යානුකූල අයිතිය වෙනත් රාජ්‍ය ආයතන සතුව පවතින අතර ඒවායේ අයිතිය විධිමත්ව පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය කාර්යාල 03ක් යටතේ පවතින නිල නිවාස 12ක් වසර 03සිට 10 දක්වා කාලයක් පරිහරණයට නොගැනීමෙන් එම නිවාස ගරා වැටෙන තත්ත්වයට පත් වී තිබුණු අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවට ලබා ගත හැකි අදායම් මාර්ගයන් ද අහිමිවී තිබුණි.

(ඈ) වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලින් මෙම දෙපාර්තමේන්තුවට ලැබී වසර 01 සිට 11 දක්වා කාලයක් ගත වී තිබුණු දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහන 04ක් හා යතුරුපැදි 16 ක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නමට ලියාපදිංචි කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

4. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 481ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 422ක් වූ බැවින් කාර්යමණ්ඩල පුරප්පාඩු 59ක් විගණනයේදී නිරීක්ෂණය විය. තත්‍ය කාර්ය මණ්ඩලය හා සලකා අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 13 ක් පැවති අතර ඒ තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 02 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 03 ක් පැවතිය ද 2020 වර්ෂයේ සිට බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.



වී.ඩී. සීතා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

3.6. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022	2021
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	823,196,685	819,065,496
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	53,748,863	52,129,215
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**876,945,548**	**871,194,711**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		47,150,993	46,633,324
දේපළ පිරියත හා උපකරණ සංචිතය		823,196,685	819,065,496
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	6,597,870	5,495,891
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		-
මුළු වගකීම්		**876,945,548**	**871,194,711**

පිටු අංක...01.....සිට ...23..... දක්වා ඒසිඒ ඒප් සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...24..... සිට .....29.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරවි කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2023.02.27	දිනය : 27.02.2023	දිනය : 2023.02.27
Janaka Dharmakeerthi Secretary Ministry of Plantation Industries 11th Floor, Sethsiripaya Stage II, Battaramulla.	මාධව වර්ණකුලසූරිය අධ්‍යක්ෂ ජනරාල් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව අංක. 465, ගනහේන, බත්තරමුල්ල.	එච්.එම්.එස්.ආර්. හේන්සේකා ප්‍රධාන ගණකාධිකාරි රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව අංක. 465, ගනහේන, බත්තරමුල්ල.

3.7. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සි

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2022 රු.	**2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු ,අධිභාර, දඩ මුදල් හා බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	327,922,242	399,227,461
අග්‍රිම ලැබීම්	722,250,000	870,420,000
අත්තිකාරම් අයකර ගැනීම්	22,954,509	17,403,083
තැන්පතු ලැබීම	91,214,920	120,498,664
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (අ)	**1,164,341,671**	**1,407,549,208**
අඩුකළා : මුදල් වැයකිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	357,998,048	346,779,160
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	1,848,218	2,619,150
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	22,715,386	972,642
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	24,854,799	19,632,687
තැන්පතු ගෙවීම්	90,112,941	121,470,510
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයන් (ආ)	**497,529,392**	**491,474,149**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)-(ආ)	666,812,279	916,075,059
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-

භූමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)	-	-
අඩුකළා - මුදල් වැයකිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	666,812,279	916,075,059
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	666,812,279	916,075,059
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්(ඊ)=(ඇ)-(ඉ)		
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)	**666,812,279**	**916,075,059**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඌ)	-	-
අඩුකළා - මුදල් වැයකිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වගු අංක XXXVIII

4. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	ඉලක්කය	ප්‍රගතිය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම
1. නැවත වගා කළ බිම් ප්‍රමාණය -කුඩාවතු (හෙක්.)	500	522.44	105%
2. නැවත වගා කළ බිම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.)	700	754.07	108%
3. නව වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	500	489.44	98%
4. රබර් පැළ නිෂ්පාදනය - දෙපාර්තමේන්තු පැළ තවාන්වල (පැළ)	1,500,000	1,310,904	87%
5. වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - කුඩා වතු (හෙක්.)	800	816.92	102%
6. වැහි ආවරණ යෙදූ ඉඩම් ප්‍රමාණය - වැවිලි සමාගම් (හෙක්.)	2,500	2,773.84	111%
7.අතුරු බෝග වගාව (හෙක්.)	250	258.31	103%
8. රබර් කිරි කැපීම සාමාන්‍ය පුහුණුව ලැබූ සංඛ්‍යාව - (පුද්ගලයන්)	400	433	108%
9.රබර් කිරි කැපීම වෘත්තීය පුහුණුව ලැබූ සංඛ්‍යාව - (පුද්ගලයන්)	150	155	103%
10. වැහි ආවරණ පුහුණුව ලැබූ සංඛ්‍යාව - (පුද්ගලයන්)	250	295	118%
11. රබර් රෝග පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුව ලැබූ සංඛ්‍යාව - (පුද්ගලයන්)	250	308	123%
12. බද්ධ පුහුණුව ලැබූ සංඛ්‍යාව (පුද්ගලයන්)	60	59	98%

5. තිරසාර සංවර්ධන අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්කය	ප්‍රගතිය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය
විශේෂයෙන්ම දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වභාවික සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.	1. නව වගාව - කුඩා වතු සඳහා හෙක්. 500 2. නැවත වගාව - කුඩා වතු සඳහා හෙක්. 500	489.44 522.44	හෙක්. හෙක්.	98% 105%
2030 වන විට තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ භානිකර කාලගුණ තත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම.	1. වැහි ආවරණ යෙදීම කුඩා වතු - හෙක්. 800 2. වැහි ආවරණ යෙදීම වැවිලි සමාගම් - හෙක් 2,500 3. අතුරු බෝග වගා කිරීම හෙක්. 250	816.92 2773.84 258.31	හෙක්. හෙක්. හෙක්.	102% 111% 103%
2021 වන විට බීජවල, වගාකරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවිධත්වය පවත්වාගෙන යාම සහ ඔහුදින් කළමනාකරණය කරන ලද සහ විවිධත්වයන්ගෙන් යුත් බීජ සහ ශාක බැංකු ජාතික කලාපීය සහ අන්තර්ජාතික මට්ටමින් පවත්වාගෙන	රජයේ පැළ තවාන්වල බද්ධ රබර් පැළ නිෂ්පාදනය පැළ 1,500,000 ක් නිෂ්පාදනය කිරීම.	1,310,904	හෙක්.	87%

යාම සහ අන්තර්ජාතික වශයෙන් එකඟ වූ ආකාරයට ජාන සම්පත් සහ පාරම්පරික දැනුම උපයෝගි කරගැනීම මගින් ලබාගන්නා වූ ප්‍රතිලාභවලට ප්‍රවේශවීම සහ සමානව භුක්ති විඳීම තහවුරු කිරීම.				
විශේෂයෙන් අවම වශයෙන් දියුණු වූ රටවල් ඇතුළුව දියුණු වෙමින් පවත්නා රටවල කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා, ඉහළ නංවන ලද අන්තර්ජාතික සහයෝගීතාවයෙන් ග්‍රාමීය යටිතල පහසුකම්, කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන්, තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජන වැඩි කිරීම.	කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබාදීම - පුද්ගලයන් 400	433	පුද්ගලයන්	108%
	බද්ධකරුවන් පුහුණු කිරීම පුද්ගලයන් 60	59	පුද්ගලයන්	98%
	රබර් රෝග පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුව ලබා දීම- පුද්ගලයන් 250	308	පුද්ගලයන්	123%
2020 වන විට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට ප්‍රවේශවීමේ හැකියාව කැපී පෙනෙන ආකාරයට වර්ධනය කිරීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට අඩු මිලට සහ සැමටම අන්තර්ජාලය වෙත ප්‍රවේශවීමේ අවස්ථාව සැලසීමට ප්‍රයත්න දැරීම.	ප්‍රාදේශීය කාර්යාලවලින් භාවිතයෙන් ඉවත් කර ඇති අක්‍රීය තත්ත්වයේ පවතින පරිගණක ගෙන්වා සහනාධාර ගෙවීමේ වැඩසටහනට යෝග්‍යවන අයුරින් Oracle මෘදුකාංග ස්ථාපනයට සුදුසු පරිගණක එකලස් කිරීම සඳහා වැඩසටහනක් ඇරඹීම. සහනාධාර ගෙවීමේ පරිගණක වැඩසටහන සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීම හා අදාළ නිලධාරින්ට එම වැඩසටහන පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. මාර්ග ගත ක්‍රමය ඔස්සේ දෙපාර්තමේන්තු සේවා (Video Conferencing) පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැපයීම. RIMS ව්‍යාපෘතියේ II අදියර ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදන කම්ටුවක් පත්			

	කිරීම හා මෘදුකාංග සංවර්ධන හා නඩත්තු කටයුතු සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීම සඳහා තාක්ෂණික පිරිවිතර හා ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම.			
2030 වන විට ආබාධිත පුද්ගලයන් සහ යෞවනයින්ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථා ලබාදීම. **කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම.**	කිරි කැපුම් ශිල්පී සාමාන්‍ය පුහුණුව ලබාදීම - පුද්ගලයන් 400 වැසි ආවරණ යෙදීමේ පුහුණුව ලබා දීම -250	433 295	පුද්ගලයන් පුද්ගලයන්	108% 118%

වගු අංක XL

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2022 වර්ෂයේ දී රබර් නව වගාව සහ නැවත වගාව මගින් හෙක්ටයාර 1,781ක් වගා කරමින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට දායකත්වය ලබා දී ඇත. මෙමගින් වන ආවරණය වැඩි වීම තුළින් වායුගෝලීය ඔක්සිජන් ප්‍රතිශතය ඉහළ නැංවීමට දායක වීම තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම යටතේ ලද ජයග්‍රහණයකි. කොවිඩ් 19 වසංගතය හමුවේ ලංකාව තුළ විශාල පසුබෑමක් පසුගිය වර්ෂවල ඇතිවුවද, 2022 වසරේදී අපේක්ෂිත ඉලක්ක අභිබවමින් නැවත වගාව,පැළ නිෂ්පාදනය හා වැසි ආවරණ යෙදීම ආදි අංශයන් ඉහළ ප්‍රගතියක් ලබා තිබේ. එසේම 2022 වසර තුළදී රබර් වගාව ආශ්‍රිතව ඇතිවන රෝග හඳුනා ගැනීම හා ඒවාට ප්‍රතිකාර හඳුන්වා දීමේ කාර්යය කෙරෙහි දෙපාර්තමේන්තු අවදානය වැඩි වශයෙන් යොමු කර ඇත.

6. මානව සම්පත් පැතිකඩ

6.1 . සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	37	24	13
තෘතියික	21	08	13
ද්විතියික	339	324	15
ප්‍රාථමික	84	66	18
කොන්ත්‍රාත්/ අනියම්	-	324	-
	481	**746**	**59**

වගු අංක XLI

6.2. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	**පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව**	**වැඩ සටහනේ කාල සීමාව**	**සමස්ත ආයෝජනය (රුපියල්)**		**වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)**	**නිමැවුම/ ලබා ගත් දැනුම**
			දේශීය	**විදේශීය**		
කණ්ඩායම් ක්‍රියාකාරකම් සහිත පුහුණු වැඩසටහන	50	දින 01	145,000.00	-	දේශීය	නායකත්ව ගුණාංග,කණ්ඩායම් හැඟීම් හා ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීම
පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා	2	වර්ෂ 01	119,700.00	-	දේශීය	පශ්චාත් උපාධිය
දෙවන භාෂා (දෙමළ පුහුණුව)	2	පැය 150	20,000.00	-	දේශීය	දෙමළ භාෂා ප්‍රවීණතාවය ලැබීම

වගු අංක XLII

6.3. රජයේ පැළ තවාන්වල සේවක සංඛ්‍යාව - 2022.12.31 දිනට

තවානේ නම	සේවක සංඛ්‍යාව (කොන්ත්‍රාත් පදනම)
වැලිකඩමුල්ල තවාන	46
මීරිගම තවාන	35
ඇඟල්ඔය තවාන	37
ගුරුගොඩ තවාන	35
කරපිංච තවාන	31
කුඹුක්කන තවාන	89
පදියතලාව තවාන	32
මිද්දෙනිය තවාන	19
එකතුව	**324**

වගු අංක XLIII

6.4. ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්හි දායකත්වය

පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කිරීමෙන් ඔවුන්ගේ විෂයානු බද්ධ දැනුම හා ආකල්ප වර්ධනය කිරීම තුළින් ඔවුන් කාර්යාක්ෂමව හා ඵලදායිව සේවය කිරීම නිසා ආයතනයේ කාර්ය සාධනය වැඩි කර ගැනීමට හැකියාව ලැබී ඇත.පවත්වන ලද පුහුණු වැඩසටහන් පහත පරිදි වේ.

වැඩසටහනේ නම	සහභාගී වූ සංඛ්‍යාව	වියදම (රු.)
ඉඩම් කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන	70	37,050.00
භාණ්ඩ සමීක්ෂණ හා ගබඩා කළමනාකරණ පිළිබඳ පුහුණුව	22	8,500.00
කායීාල නිලධාරීන්,ක්ෂේත්‍ර නිලධාරීන් හා තවාන් සේවක පුහුණුව	160	80,400.00
කායීාල නිලධාරීන්,ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පුහුණුව	50	42,700.00
තවාන් සේවකයින් සඳහා බද්ධකරු පුහුණු වැඩසටහන	40	31,300.00
රබර් තොරතුරු කළමණාකරණ පද්ධති සම්බන්ධව නේවාසික වැඩසටහන (නිලධාරීන් 16ක් සඳහා)	30	57,222.00
රබර් තොරතුරු කළමණාකරණ පද්ධති සම්බන්ධව වැඩසටහන		78,009.00
රජයේ වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණුව	2	36,000.00
රබර් සංවර්ධන නිලධාරීන් සඳහා කිරි කැපුම් ශිල්පී පුහුණුව	29	93,900.00

ටෙන්ඩර් පත්‍රිකා සකස් කිරීම පිළිබඳ පුහුණුව- මෙට්‍රොපොලිටන් උසස් අධ්‍යාපන ආයතනය	1	18,000.00
ඉඩම් නීතිය හා කාර්ය පටිපාටි රීති සංග්‍රහ පුහුණුව	50	213,600.00
තවාන් කාරක ගිණුම් පිළියෙල කිරීම් පුහුණු වැඩසටහන	24	16,712.50

වගු අංක XLIV

6.5. 2022 වර්ෂයේ ඉදි කිරීම් ප්‍රගතිය

වැඩ විෂය	ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)	භෞතික ප්‍රගතිය %	වියදම (රු.මි.)
කරපිංච රබර් පැල තවානේ කළමණාකරුගේ නිල නිවාස අලුත්වැඩියාව	1.909	100%	1.739
ගාල්ල ප්‍රාදේශීය කාර්යාලයේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියාව.	0.708	100%	0.391
හොරණ අරමනාගොල්ල ර.සං.නි. නිල නිවාසය අලුත්වැඩියාව.	0.999	100%	0.994
මීරිගම තවානේ ගරාජයේ වහලය අලුත්වැඩියාව.	0.565	100%	0.562
කරපිංච රබර් පැල තවානේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියාව	0.819	100%	0.746
ඇඟල්ඔය තවානේ බද්ධ අතු තවාන් සඳහා බිම් සකස් කිරීම	0.249	100%	0.248
ඇඟල්ඔය තවානේ බද්ධ අතු තවාන් සඳහා බිම් සකස් කිරීම	0.220	100%	0.220
ගුරුගොඩ තවානේ බද්ධ අතු තවාන් සඳහා බිම් සකස් කිරීම	0.250	100%	0.250
මිද්දෙනිය තවානේ ජල සම්පාදන පද්ධතිය අළුත්වැඩියාව	0.600	100%	0.462
කරපිංච තවානේ බද්ධ අතු තවාන් සඳහා බිම් සැකසීම	0.303	100%	0.275
වැලිකඩමුල්ල තවානේ ජල සම්පාදන පද්ධතිය අළුත්වැඩියා	0.300	100%	0.279

මීරිගම තවානේ බීජ පාත්තිය අළුත්වැඩියා කිරීම	0.200	100%	0.186
මීරිගම තවානේ බද්ධ අතු තවානක් ස්ථාපනය කිරීම	0.300	100%	0.264
මීරිගම තවානේ ජල සම්පාදන පද්ධතිය අළුත්වැඩියා	0.153	100%	0.152
වැලිකඩමුල්ල තවානේ බද්ධ අතු තවාන් සඳහා බිම් සකස් කිරීම	0.348	100%	0.231
මුළු එකතුව	**7.923**		**6.999**

වගු අංක XLV

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.		
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.8	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	වාහන සම්බන්ධව අනුකූල වේ.		
2.9	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන	අනුකූල වේ.		

	පරිදි බලතල පවරා දී තිබීම			
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මaදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	සමාලෝචිත වර්ෂය සඳහා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව අයවැය අනුමත කරගෙන තිබීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.6	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
4.7	කාර්තු වාර්තා නියමිත දිනට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම.	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA /1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු	අනුකූල වේ.		

	04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	වාහන සඳහා අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂය නිරවුල් කර තිබීම	අනුකූල නොවේ.	අය කර ගැනීමට නොහැකි වීම.	අය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් නිලධාරීන් දෙදෙනෙකුට නඩු පවරා ඇත.
13	**පොදු තැම්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරතිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	ර.ස.දෙපා.ආදායම් එකතු කිරීමේ දෙපාර්තමේන්තුවක් නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රාකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කොට තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		